6.1.6 මෝටර් වාහන

i අවමංගල රථ සඳහා නිෂ්පාදන බදු සංශෝධනය කෙරේ.

ii ශක්ති කාර්යක්ෂමතා ප්‍රතිලාභය පිලිබිඹු වන පරිදි හයිබ්‍රිඩ් සහ ඉලෙක්ට්‍රික් වැන් මත නිෂ්පාදන බද්ද සංශෝධනය කෙරේ.

iii සින්ගල් කැබ් මත නිෂ්පාදන බද්ද සංශෝධනය කෙරේ.

iv කි.ග්‍රෑ. 2000 ට නොවැඩි භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවයක් සහිත කුඩා ලොරි රථවල නිෂ්පාදන බද්ද අඩුකෙරේ.

v මගී වාහන මත නිෂ්පාදන බද්ද පහත සඳහන් පරිදි වෙනස් කෙරේ.

(අ) ඉන්ධන මෝටර් රථ සඳහා වන බදු අනුපාත

එන්ජින් ධාරිතාව	පෙට්‍රල් ඉන්ධන (ඝණ සෙන්ටිමීටරයට රු.)	ඩීසල් ඉන්ධන (ඝණ සෙන්ටිමීටරයට රු.)
$\leq 1000cm^3$	2,000 or 1,650,000*	4,600
$1000cm^3 < x \leq 1300\ cm^3$	3,200	4,600
$1300cm^3 < x \leq 1500\ cm^3$	3,700	4,600
$1500cm^3 < x \leq 1600\ cm^3$	4,250	5,750
$1600cm^3 < x \leq 1800\ cm^3$	5,300	6,900
$1800cm^3 < x \leq 2000\ cm^3$	6,350	8,000

*ඒකකයක් සඳහා බද්ද

(ආ) දෙමුහුන් මෝටර් රථ සඳහා වන බදු අනුපාත

එන්ජින් ධාරිතාව	පෙට්‍රල් ඉන්ධන (ඝණ සෙන්ටිමීටරයට රු.)	ඩීසල් ඉන්ධන (ඝණ සෙන්ටිමීටරයට රු.)
$\leq 1000cm^3$	1,500,000*	3,400
$1000cm^3 < x \leq 1300\ cm^3$	2,300	3,400
$1300cm^3 < x \leq 1500\ cm^3$	2,850	3,400
$1500cm^3 < x \leq 1600\ cm^3$	4,000	4,600
$1600cm^3 < x \leq 1800\ cm^3$	5,200	5,700
$1800cm^3 < x \leq 2000\ cm^3$	5,700	6,900

*ඒකකයක් සඳහා බද්ද

(ඇ) විද්‍යුත් මෝටර් රථ සඳහා වන බදු අනුපාත

යාන්ත්‍රික බලය	අවු. 01ට අඩු	අවු. 01ට වැඩි සහ අවු. 03ට අඩු
50kW< x ≤ 100kW	10,000	20,000

(ඈ) ත්‍රී රෝද රථ සඳහා වන බදු අනුපාත

වර්ගය	රු. (ඝණ සෙන්ටිමීටරයට/ කිලෝ වොට් එකකට)
පෙට්‍රල් (ඝණ සෙන්ටිමීටර)	2,400
ඩීසල් (ඝණ සෙන්ටිමීටර)	1,450
විද්‍යුත් (කිලෝ වොට්)	7,500
භාණ්ඩ ප්‍රවාහන - පෙට්‍රල් (ඝණ සෙන්ටිමීටර)	500
භාණ්ඩ ප්‍රවාහන - ඩීසල් (ඝණ සෙන්ටිමීටර)	375
භාණ්ඩ ප්‍රවාහන - විද්‍යුත් (කිලෝ වොට්)	7,500

(ඉ) මෝටර් බයිසිකල් සඳහා වන බදු අනුපාත

එන්ජිං ධාරිතාව	ඝණ සෙන්ටිමීටරයට රු.
$x \leq 50cm^3$	575
$50cm^3 < x \leq 150cm^3$	1,150
$150cm^3 < x \leq 200cm^3$	1,150
$200cm^3 < x \leq 250cm^3$	1,725
$250cm^3 < x \leq 350cm^3$	1,725
$350cm^3 < x \leq 450cm^3$	2,300
$450cm^3 < x \leq 500cm^3$	2,300
$500cm^3 < x \leq 800cm^3$	2,875
$800cm^3 < x \leq 1000cm^3$	2,875
$1000cm^3 < x$	3,450

8.1 කාබන් බද්ද

වාණිජ වාහන මත ගෙවිය යුතු උපරිම කාබන් බද්ද පහත පරිදි උපරිම සීමාවකට යටත් වේ.

වාහනයේ වර්ගය	වසර 5 ට අඩු	වසර 05 සිට 10 දක්වා	වසර 10 ට වැඩි
දෙමුහුන් (පෙට්‍රල්/ ඩීසල්)	ඝණ සෙන්ටිමීටරයට ශත 25 හෝ රු. 3,500 යන ඒවායින් වඩා අඩු අගය	ඝණ සෙන්ටිමීටරයට ශත 50 හෝ රු. 5,500 යන ඒවායින් වඩා අඩු අගය	ඝණ සෙන්ටිමීටරයට රු. 1 හෝ රු. 7,500 යන ඒවායින් වඩා අඩු අගය
ඉන්ධන (පෙට්‍රල් / ඩීසල්)	ඝණ සෙන්ටිමීටරයට ශත 50 හෝ රු. 3,500 යන ඒවායින් වඩා අඩු අගය	ඝණ සෙන්ටිමීටරයට රු. 1 හෝ රු. 5,500 යන ඒවායින් වඩා අඩු අගය	ඝණ සෙන්ටිමීටරයට රු. 1.50 හෝ රු. 7,500 යන ඒවායින් වඩා අඩු අගය

8.2 සුඛෝපභෝගී වාහන බද්ද

i බදු නිදහස් සීමාව ඉක්මවන, අදාලවන පරිදි මි.ර.ගැ. වටිනාකම හෝ නිෂ්පාදන මිල මත සුඛෝපභෝගී වාහන බද්ද පැනවේ.

වාහනයේ වර්ගය	සුඛෝපභෝගී බදු නිදහස් සීමාව	අනුපාතය (සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ඉක්මවා යන අගය මත අය කෙරේ)
ඩීසල්	රු. මි. 3.5	120%
පෙට්‍රල්	රු. මි. 3.5	100%
දෙමුහුන් ඩීසල්	රු. මි. 4.0	90%
දෙමුහුන් පෙට්‍රල්	රු. මි. 4.0	80%
විද්‍යුත්	රු. මි. 6.0	60%

ii සුඛෝපභෝගී බදු නිදහස් සීමාව ආනයනික වාහන සම්බන්ධයෙන් මි.ර.ගැ. වටිනාකම පදනම්වද, දේශීයව එකලස් කරන ලද වාහන සම්බන්ධයෙන් නිෂ්පාදන මිල පදනම්වද දැක්වේ.

17.3 වාහන ලියාපදිංචි අංකයක් වෙන්කර ගැනීමේ ගාස්තු වත්මන් ලියාපදිංචි අංකයේ සිට පහත පරිදි වෙනස් කරනු ලැබේ.

ගාස්තු (රු.)	**පවතින අංක සීමාව**
70,000/-	10,000
90,000/-	20,000
100,000/-	30,000

17.4 රු. මිලියන 1 ක ගාස්තුවක් අය කර, ජීවිත කාලය සඳහාම වන පෞද්ගලික වාහන ලියාපදිංචි අංක නිකුත් කරනු ඇත.